මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு

පොදු කාර්යාලය :011-2868441, 2868442, 2868443,2885439
பொது அலுவலகம்
General Office
ෆැක්ස්/தொலைநகல்/Fax:011-2868426
Web: www.elections.gov.lk

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය(10107)
தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்
சரண மாவத்தை, இராஜகிரிய(10107)
E-mail: info@elections.gov.lk

මගේ අංකය:EC/LI/15/III | ඔබේ අංකය: | දිනය: 2024.08.13
எனது இல. : | உமது இல.: | திகதி:

**චක්‍රලේඛ අංක PRE/2024/07**

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත,

## 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමන පනතේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස්

ඉදිරියේ දී පැවැත්වීමට නියමිත මැතිවරණවලට අදාළව ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ දින සිට දින 60ක් ගතවන තෙක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත යටතේ කටයුතු කිරීම සඳහා විශේෂ වූ ඒකකයක් දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයට අනුබද්ධ අනු ඒකකයක් ලෙස පවත්වාගෙන යා යුතු ය. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයට අනුබද්ධ විශේෂිත අනු ඒකකයක් ලෙස පිහිටුවනු ලබන මෙම ඒකකයේ කාර්යභාරය එක් එක් මැතිවරණවලට අදාළව වෙනස් විය හැකි අතර, පහත උපදෙස් මාලාව ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා අදාළ කර ගත යුතු වේ.

### 01. අවසරලත් මුදල, වාර්තා භාර ගැනීම හා ප්‍රදර්ශනය කරන ස්ථාන තීරණය කිරීම

1.1 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා නාමයෝජනා භාර ගත් දිනයේ සිට දින පහක් ඇතුළත මැතිවරණ කොමිෂන් සභාව විසින් තරග කරනු ලබන අපේක්ෂකයන් විමසා අවසරලත් මුදල තීරණය කරනු ඇත.

1.2 එම ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කොට අවසන් වූ දින සිට දින 21 ක් ඇතුළත ඡන්ද විමසීම සඳහා තරග කරන ලද අපේක්ෂකයන් විසින් අත්සන් කර සහතික කර භාර දෙනු ලබන ආදායම් හා වියදම් වාර්තා මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටුවනු ලබන විශේෂිත අනු ඒකකයේ දී භාර ගැනිමට කටයුතු යොදා ඇත. එලෙස භාර ගනු ලබන සෑම වාර්තාවකම සහතික කරන ලද පිටපතක් සෑම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයකටම යොමු කරනු ලැබේ.

1.3 එසේම, අදාළ කාල සීමාව වන දින 21 ක් ඇතුළත ලැබුණු එම ආදායම් හා වියදම් වාර්තා, එකී 21 වන දිනයෙන් පසුව එළඹෙන දින 10 ක් තුළ, ලංකාවේ පුරවැසියන්හට පරීක්ෂා කර බැලිය හැකි ස්ථාන, දින හා වේලාව සඳහන් කොට භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් 03ක් පළ කරනු ඇත. ඒ සඳහා ඔබ තෝරා ගත් ස්ථානය පිළිබඳ විස්තර 2024.08.15 දිනට ප්‍රථම ප්‍රධාන කාර්යාලයට යොමු කළ යුතු ය.

1.4 මේ අනුව, ඉහතින් සඳහන් කරන ලද දින 60ක කාලය යනු ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම පවත්වා අවසන් වූ පසුව එක් එක් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයන් විසින් දින 21 ක් වන උක්ත මැතිවරණ වියදම් පිළිබඳ වාර්තාව භාර දෙන කාලයත්, දින 10ක් වන ස්ථාන දැනුම් දෙන දැන්වීම පළ කළ යුතු කාලයත් හා දින 30 ක් වන අදාළ වියදම් වාර්තා පරීක්ෂා කිරීමට දෙන කාලයත් වේ.

**02. දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයට අනුබද්ධ මැතිවරණ වියදම් නියාමනය කිරීමේ විශේෂිත අනු ඒකකය**

2.1 ජනාධිපතිවරණ ඡන්ද විමසීමක දී, මෙම දිස්ත්‍රික් ඒකකය මඟින් මැතිවරණ වියදම් නියාමනය කිරීමේ ආදායම් හා වියදම් වාර්තා භාර ගැනීමේ කාර්යය සිදු නොකළ ද ප්‍රධාන කාර්යාලය මඟින් භාර ගෙන ඔබ වෙත එවනු ලබන තරග කළ අපේක්ෂකයන්ගේ ආදායම් හා වියදම් වාර්තාවල පිටපත් පරීක්ෂා කිරීමට සහ ඒ සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ වැඩ පිළිවෙළක් මෙම ඒකකය මඟින් ස්ථාපිත කළ යුතු ය.

**03. ජනාධිපතිවරණ ඡන්ද විමසීම් කාල සීමාවක දී දිස්ත්‍රික් අනු ඒකකය පවත්වාගෙන යා යුතු ආකාරය**

3.1 අවසන් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ පසු දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය විවෘතව තබන වේලාවන්හි දී මෙම ඒකකය විවෘතව තැබෙන අතර ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර දින 60ක් ගතවන තෙක් මෙම ඒකකය ක්‍රියාත්මක වනු ඇත.

3.2 ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර සතියකට පසු මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය කටයුතු අවසන් වුව ද මෙම ඒකකයේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යැමට වැඩපිළිවෙළක් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් සැකසිය යුතු වේ. ඒ සඳහා සහකාර තේරීම්භාර නිලධාරියකු, කළමනාකරණ සේවා නිලධාරියකු සහ කාර්යාල කාර්යය සහයක සේවයකු අනුයුක්ත කිරීම ප්‍රමාණවත් වේ.

3.3 ලබා දී ඇති උපදෙස් අනුව මෙම ඒකකය මඟින්, ප්‍රධාන කාර්යාලය මඟින් භාර ගෙන ඔබ වෙත එවනු ලබන ආදායම් හා වියදම් වාර්තාවල පිටපත් පරීක්ෂා කිරීමට හා ඒ සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට අවශ්‍ය පහසුකම් සැලැසීම සිදු කළ යුතු ය. මේ සඳහා ලබා දී ඇති උපදෙස් පරිදි විධිමත් ක්‍රියා පරිපාටියක් අනුගමනය කළ යුතු ය.

3.4 දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයට පත් කරනු ලබන සහකාර තේරීම්භාර නිලධාරියකු සහ කළමනාකරණ සේවා නිලධාරී පළමුවන පන්තියේ හෝ දෙවන පන්තියේ නිලධාරියකු මෙම ඒකකයට අනුයුක්ත කළ හැකි ය. මෙම සහකාර තේරීම්භාර නිලධාරියා හා කළමනාකරණ සේවා නිලධාරියා විසින් විවිධ පාර්ශ්ව පැමිණ සිදු කරන පරීක්ෂා කිරීම්වලට පහසුකම් සැලසීමත් පැමිණිලි භාර ගැනීමත් සිදු කළ යුතු හෙයින් කාර්යාල වේලාවන් තුළ දී මධ්‍යස්ථානයේ රැඳී සිටීමට උපදෙස් ලබා දිය යුතු ය. එසේම ඒ සඳහා මනා කැපවීමක් හා උපරිම ධාරිතාවක් සහිත නිලධාරීන් දෙදෙනෙකු තෝරා ගැනීමට ද කටයුතු කළ යුතු ය. ක්ෂේත්‍ර කටයුතු නොමැති හෙයින් ඒකකයට ඉන්ධන හෝ වාහන ලබා දීම අවශ්‍ය නොවේ.

**04. වියදම් වාර්තා තබා තිබෙන ස්ථාන ප්‍රසිද්ධ කිරීම**

4.1 මැතිවරණ කොමිෂන් සභාව විසින් පනතේ 7(2) වගන්තිය ප්‍රකාරව වාර්තා භාරදුන් දින සිට දින 10ක් ඇතුළත අපේක්ෂකයන් විසින් හා පිළිගත් දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දෙනු ලබන වියදම් වාර්තා, යම් තැනැත්තෙකුට පරීක්ෂා කර බැලීමට හැකියාව පවතින ස්ථාන, දින හා වේලාව සඳහන් කරමින් ජාතික පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීමක් පළ කරනු ඇත.

4.2 මෙම දැන්වීම මඟින් පරීක්ෂා කරන ලද ලේඛන සම්බන්ධව යම් පැමිණිලි වෙතොත් එම පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාරය ද එහි සඳහන් කරනු ඇත .

4.3 මෙම වාර්තා සුරක්ෂිතව ගබඩා කර ගැනීමට සුදුසු ස්ථානයක් ඔබ විසින් පූර්වයෙන් හඳුනා ගත යුතු වේ. වාර්තා ප්‍රදර්ශනය කරනු ලබන ස්ථානය පිළිබඳ මෙම චක්‍රලේඛයේ 1.3 අනුව දන්වා එවීමට කටයුතු කරන්න.

05. ජනාධිපතිවරණයක දී ආදායම් හා වියදම් වාර්තාව භාර ගැනීම, දිස්ත්‍රික් කාර්යාලවලට පිටපත් යොමු කිරීම සහ සංරක්ෂණය කිරීම

5.1 සෑම ආදායම් හා වියදම් වාර්තාවක්ම මැතිවරණ කොමිෂන් සභාවට ලැබුණු පසුව එම වාර්තා පරීක්ෂා කොට බලා දින මුද්‍රා තබා සියලුම පිටපත්වල මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් හෝ බලය පැවරූ වෙනත් නිලධාරියකු විසින් හෝ කෙටි අත්සන් කර උපලේඛන 07 අනුව වූ දෛනික තොරතුරු සටහන් ලේඛනයට ඇතුළත් කළ යුතු අතර එම වාර්තා ලබා දුන් හා තොරතුරු ඇතුළත් කළ තැනැත්තාගේ නම හා අත්සන ද එහි ඇතුළත් කිරීම කරනු ලැබේ.

5.2 ලැබෙන වියදම් වාර්තා සියල්ල පරිලෝකනය (Scan) කොට මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට උඩුගත කිරීම මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කිරීමට සැලසුම් කර ඇති බැවින් වියදම් වාර්තා සඳහා වෙන වෙනම හඳුනාගත හැකි ගොනු ක්‍රමවේදයක් සැකසෙනු ඇත.

5.3 වියදම් වාර්තා සියල්ල ඡායා පිටපත් කර මුල් පිටපත ගොනුගත කර සුරක්ෂිත කරන අතර, ඡායා පිටපත් කරන ලද මුල් පිටපතේ සත්‍ය අනුපිටපත් වාර්තාව අවශ්‍ය ඕනෑම අයකුට පරීක්ෂා කර බැලීමට හැකිවන පරිදි නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ විධිමත් අයුරින් ගොනු කර තබනු ලැබේ.

5.4 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමේ දී මැතිවරණ කොමිෂන් සභාවේ පිහිටුවනු ලබන විශේෂිත අනු ඒකකය මඟින් භාර ගනු ලබන මෙම ආදායම් හා වියදම් වාර්තාවල මුල් පිටපතෙන් ලබා ගන්නා, ඡායා පිටපත් සෑම දිස්ත්‍රික්ක නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකුටම Fax/ Email/ WhatsApp මඟින් හැකි ඉක්මනින් ලබා දීම සිදු කෙරේ.

5.5 එම පිටපත දිස්ත්‍රික්කය වෙත ලද පසු ඒවායේ පිටපත් ලබා ගෙන ඔබ විසින් එම පිටපත් මහජන ප්‍රදර්ශනය සඳහා දැනුම් දී ඇති ස්ථානවල ප්‍රදර්ශනය සඳහා තැබිය යුතු ය.

5.6 පැමිණිලි සහ විමර්ශන කටයුතු සඳහා ආදායම් හා වියදම් වාර්තා පොලීසිය වෙත ඉදිරිපත් කිරීමේ දී එම වාර්තාවල මුල් පිටපත භාරදිය යුතු බැවින්, ඒ සම්බන්ධව උපලේඛන 08 ආකෘතියට අදාළව තොරතුරු තබා ගැනීම සිදු කරනු ලැබේ.

5.7 භාරගත් සියලුම ආදායම් හා වියදම් වාර්තා ලබාදුන් තැනැත්තා/ පක්ෂය/ ස්වාධීන කණ්ඩායම ආදිය සඳහන් කරන ලද ලේඛනයක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයීය දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීම කළ යුතු වේ.

5.8 පැමිණිලි ඉදිරිපත් නොවුණ වාර්තා සුරක්ෂිතව තබා ගන්නා අතර, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ප්‍රකාරව වසර 12 ක් මෙම ලේඛන තබාගත යුතු වේ. පරිලෝකනය කරනු ලබන ලේඛන සුරක්ෂිතව පවතින බැවින් හා පවතින ඉඩ පහසුකම් බලා අවශ්‍යතාව සලකා සුදුසු කාලයක දී විනාශ කිරීමට අවශ්‍ය අනුමැතිය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටීමට කටයුතු කරනු ඇත.

5.9 වියදම් වාර්තාව, ආදායම් වාර්තාව, අදාළ සාක්ෂි හා දිවුරුම් ප්‍රකාශ ආදිය පරීක්ෂා කිරීමේ දී පනතේ සඳහන් තොරතුරු නිශ්චිතව තිබේ ද යන්න පරීක්ෂා කර දිවුරුම් ප්‍රකාශය නියමිත පරිදි අත්සන් කර තිබේ ද යන්න පරීක්ෂා කරනු ඇත. නිවැරදිව එම කටයුතු සිදු කොට නොමැතිනම් ඒ බව අදාළ අය වෙත දැනුම් දී එකී දෝෂ වාර්තාව භාරදුන් ස්ථානයේ දීම නිවැරදි කර ගත යුතු වේ. භාර ගන්නා ලද වාර්තාවල සංශෝධන සිදු කිරීමට හෝ වෙනත් කිසිදු හේතුවකට හෝ කාර්යාලයෙන් පිටතට නොයැවීමට වගබලා ගැනීම අනිවාර්යය වේ.

5.10 උපලේඛන 07 හා උපලේඛන 08 ට අදාළ තොරතුරු දෛනිකව ගොනුගත කර සුරක්ෂිත කළ යුතු ය.

06. වියදම් වාර්තා පරීක්ෂා කිරීමට ඉඩ ලබාදීම

6.1 මැතිවරණ වියදම් වාර්තා පරීක්ෂා කිරීමට අවශ්‍ය ඕනෑම තැනැත්තෙකුට එකී ලේඛන ප්‍රසිද්ධ කරන ලද ස්ථාන වෙත ගොස් උපලේඛන 04 ආකෘතියට අනුකූල වූ ඉල්ලීමක් අදාළ තේරීම්භාර නිලධාරියාට ලබා දී ඔහුගේ අවසරය මත නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ එකී ලේඛන

පරීක්ෂාවට අවස්ථාව හිමි වේ. පසුකාලීනව බලපවත්නා වූ නෛතික ප්‍රතිපාදන යටතේ ඒවාය ක්‍රියාත්මක කරන යම් ආයතනයක් විසින් කරනු ලබන නෛතික විධානයක් හෝ ඉල්ලීමක් මත අදාළ ආයතනය වෙත යම් මැතිවරණ වියදම් වාර්තාවක සහතික කළ පිටපතක් නිකුත් කිරීමට කටයුතු කරනු ඇත.

6.2 ලේඛන පරීක්ෂා කරන අවස්ථාවේ දී එකී ලේඛන විකෘති කිරීම, හානි කිරීම හා පරිශ්‍රයෙන් බැහැරට ගෙන යෑම පොදු දේපල සුරැකීමේ පනතේ ප්‍රතිපාදනවලට අයත් යැයි සලකනු ලබන වරදක් බව සැලකිය යුතු ය. ඒ පිළිබඳ උපදෙස් ඔබ විසින් පරීක්ෂා කරන පුද්ගලයන්ට ලබා දිය යුතු ය. ඔබ වෙත ලබා දී ඇත්තේ ඡායා පිටපත් වුව ද, ඒවා ද ඉහත පරිදි හානි කර ඇත්නම් ඒ බව පරීක්ෂා කර බලා අදාළ අයට අවවාද කළ යුතු අතර නැවතත් නිවැරදි පිටපත් මහජන ප්‍රදර්ශනයට තැබිය යුතු ය.

6.3 මෙලෙස ප්‍රදර්ශනයට තබා ඇති ලේඛන කිසිදු ආකාරයකින් ඡායාරූප ලබා ගැනීම තහනම් බව ද ලේඛන පරීක්ෂා කරන පුද්ගලයන්හට දැනුම් දීමත් පරීක්ෂා කරන අවස්ථාවේ නිලධාරියකු රැඳී සිටීමට උපදෙස් ලබා දීම සුදුසු ය.

6.4 වියදම් වාර්තාවල පිටපත් ලබා ගැනීමට අවැසි පාර්ශ්ව/ පුද්ගලයන්ට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලද ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ඒවායේ පිටපතක් ලබා ගත හැකි වේ. මේ සඳහා උපලේඛන 05 ආකෘතිය භාවිතා කළ යුතු ය.

6.5 ප්‍රතිඵල ප්‍රකාශ කිරීමෙන් පසුව දින 21 ක් ඇතුළත සතියේ වැඩ කරන දිනවල කාර්යාල වේලාවන් තුළ දී එක් එක් දේශපාලන පක්ෂ, ස්වාධීන කණ්ඩායම් හා අපේක්ෂකයන් විසින් ලබාදෙන වියදම් වාර්තා භාර ගැනීමට, ඒවා සුරක්ෂිත කිරීමට, පිටපත් කිරීමට, වෙබ් අඩවියට උඩුගත කිරීම ට හා එම පරීක්ෂා කර බැලිය හැකි ස්ථාන ප්‍රසිද්ධ කළ පසු අවශ්‍ය පාර්ශ්ව වෙත ඒවා පරීක්ෂා කිරීමට හා පැමිණිලි කිරීමට හැකිවන පරිදි අවශ්‍ය සියලු කටයුතු සූදානම්ව පැවතිය යුතු ය.

07. පැමිණිලි භාරගැනීම හා නීති කටයුතු සඳහා ඉදිරිපත් කිරීම

7.1 මැතිවරණ කොමිෂන් සභාවට හෝ තේරීම්භාර නිලධාරියාට හෝ පැමිණිලි කිරීම

7.1.1 වියදම් වාර්තා පරීක්ෂා කළ තැනැත්තෙකුට එකී වාර්තාවට එරෙහිව පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් අදාළ වාර්තා පරීක්ෂා කළ ස්ථානයේ ඒවා භාරව සිටින නිලධාරියා වෙත ස්වකීය පැමිණිල්ල ලබාදිය හැකි ය. එහි දී එම පැමිණිල්ල හා එයට අදාළ වන සාක්ෂි ලේඛන හා තොරතුරු ද ඉදිරිපත් කළ හැකි ය.

7.1.2 දිස්ත්‍රික්ක ඒකකවලට පැමිණිල්ලක් ඉදිරිපත් කළ පසු එම පැමිණිලි සම්බන්ධව ප්‍රධාන කාර්යාලය වහාම දැනුම්වත් කළ යුතු ය.

7.1.3 තේරීම්භාර නිලධාරී/ මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් පැමිණිලි භාරගැනීමේ නිලධාරියා විසින් පැමිණිලි ලෙස භාරදෙනු ලබන ලේඛනවලට අමතරව අදාළ පැමිණිල්ල ලබාදෙන පුද්ගලයාගේ තොරතුරු හා අනන්‍යතාව ද උපලේඛන 06 අනුව පැහැදිලිව සටහන් කරගත යුතු ය. පැමිණිල්ල සමඟ භාරදෙන ලද ලේඛනවල විස්තරයක් ද ඊට ඇතුළත් කළ යුතු ය.

7.1.4 මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතට අදාළ පැමිණිලි මැතිවරණ කොමිෂන් සභාවට හෝ මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් අදාළ තේරීම්භාර නිලධාරියාට හෝ තැපෑලෙන් යොමු කළ හැකි ය. ඒ සඳහා අදාළ පැමිණිලිකරු එම තොරතුරු සමඟ ඔහුගේ/ ඇයගේ අනන්‍යතාව තහවුරු කළ යුතු වේ.

7.1.5 තැපෑලෙන් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි නම් එම තැනැත්තන්ට පැමිණිල්ල ලැබුණු බව දැනුම් දිය යුතු ය. උපලේඛන 06 ආකෘතිය දුරකතන ඇමතුමක් මඟින් ද සම්පූර්ණ කර ගත හැකි ය.

7.1.6 මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ද පැමිණිලි ඉදිරිපත් කළ හැකිය. එලෙස ප්‍රධාන කාර්යාලය වෙත ලැබෙන පැමිණිලි අවස්ථාවෝචිත වන පරිදි දිස්ත්‍රික් කාර්යාලවලට යොමු කෙරෙනු ලැබේ.

7.2 ඕනෑම තැනැත්තෙකුට මැතිවරණ වියදම් නියාමන පනතට අදාළ වූ පැමිණිල්ලක් ඕනෑම පොලිස් ස්ථානයක් වෙත ද යොමු කළ හැකි ය .

7.3 මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබෙන මැතිවරණ වියදම් පනතට අදාළ සියලු පැමිණිලි කොමිෂන් සභාව විසින් පොලීසිය වෙත යොමු කිරීමේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, විගණන දෙපාර්තමේන්තුවට හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට ද අවශ්‍ය පරිදි පිටපත් යොමු කරනු ලැබේ.

7.4 දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත හා පොලීසිය වෙත ලැබෙන පැමිණිලි පිළිබඳව සාරාංශගත වාර්තා දෛනිකව සකස් කර මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

7.5 මැතිවරණය/ ඡන්ද විමසීම අවසානයේ මැතිවරණ කොමිෂන් සභාව විසින් නියමිත පරිදි වියදම් වාර්තා ලබා නොදුන් පක්ෂ/ කණ්ඩායම්/ අපේක්ෂකයන්ගේ ලැයිස්තුවක් ප්‍රතිඵල නිකුත් කොට අවසන් වී දින 22කට පසුව ඉදිරි නීති කටයුතු සිදු කිරීම සඳහා අදාළ පොලිස් ස්ථානවලට යොමු කිරීම ප්‍රධාන කාර්යාලය විසින් සිදු කරනු ඇත.

7.6 වාර්තා ලබා නොදීම හා වාර්තාවලට එරෙහිව ඉදිරිපත් වන පැමිණිලි සම්බන්ධයෙන් නෛතික විධිවිධාන කඩිනමින් ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා පොලීසිය විසින් සිදු කරනු ඇති අතර ඒ සම්බන්ධව පසුවිපරම් කටයුතු මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලැබේ.

**එසේම ඔබගේ දිස්ත්‍රික්කයට විශේෂිත වූ කරුණු සම්බන්ධව තොරතුරු විමසීම සඳහා ප්‍රධාන කාර්යාලයේ අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති විමර්ශන හා සැලසුම්), නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (මැතිවරණ ආරවුල් නිරාකරණ), අධ්‍යක්ෂ (පර්යේෂණ හා ක්‍රමසම්පාදන) අමතන්න.**

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

**සමන් ශ්‍රී රත්නායක**
මැතිවරණ කොමසාරිස් ජනරාල්


සභාපති
தவிசாளர்
දුරකථන/தொலைபேசி: 011-2868444
ෆැක්ස්/தொலைநகல்:011-2868445
E-mail:chairman@elections.gov.lk

මැතිවරණ කොමසාරිස් ජනරාල්
தேர்தல்கள் ஆணையாளர் நாயகம்
දුරකථන/தொலைபேசி:011-2885207
ෆැක්ස්/தொலைநகல்:011-2885208
e-mail: cge@elections.gov.lk

අතිරේක මැතිවරණ කොමසාරිස්(නීති හා විමර්ශන)
மேலதிகத் தேர்தல்கள் ஆணையாளர் (சட்டம்மற்றும்விசாரணைகள்)
දුරකථන/தொலைபேசி: 011-2867471
ෆැක්ස්/தொலைநகல்:011-2868448
E-mail: addcomlegal@elections.gov.lk

# අපේක්ෂකයා විසින් ලබා දිය යුතු වියදම් පිළිබඳ වාර්තාව

01. අපේක්ෂකයාගේ නම/ ස්වාධීන අපේක්ෂකයාගේ නම : ........................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

02. ලිපිනය : ................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. පිළිගත් දේශපාලන පක්ෂයේ නම/ වෙනත් දේශපාලන පක්ෂයේ නම :

.......................................................................................................................................

05. උපරිම වියදම් සීමාව (රු.) : ..................................................

..................................................

අපේක්ෂකයාගේ අත්සන

දිනය : ..................................................

පක්ෂය විසින් ලබා දිය යුතු වියදම් පිළිබඳ වාර්තාව

පක්ෂ ලේකම් විසින් මෙම පෝරමය සම්පූර්ණ කළ යුතු ය.

01. පිළිගත්/වෙනත් දේශපාලන පක්ෂයේ නම : ..............................................................................

..............................................................................................................................

..............................................................................................................................

02. පක්ෂ ලේකම්ගේ නම්: ..............................................................................................

..............................................................................................................................

03. පක්ෂ ලේකම්ගේ ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපරිම වියදම් සීමාව(රු) : ..................................................

05. පක්ෂ ලේකම්ගේ එකඟතාවය : එකඟ වෙමි. / එකඟ නොවෙමි.

..........................................................

අත්සන

..........................................................

නිල මුද්‍රාව

06. දිනය : ..........................................................

උපලේඛන 01

| දිනය | වියදම් කළ කාර්යය | මූල්‍යමය වටිනාකම (රු.) | ඇමුණුම් පත්‍රිකා අංකය | එම එක් එක් වියදම දැරීම සඳහා මුදල් සපයා ගනු ලැබූ ආකාරය (ආදායම/ ලැබීම් ප්‍රභවය) | |
|---|---|---|---|---|---|
| | | | | ලැබීම් ප්‍රභවය | හැඳුනුම්පත් අංකය/ TIN අංකය |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

වියදම් කරන ලද මුළු මුදල (රු.) : ............................................................

පනතේ 5 වන වගන්තියට හා 6(5) උපවගන්තියට පූර්ණ අවධානය යොමු කරන්න.

TIN - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය

**සියලු වියදම් සනාථ කළ හැකි ලේඛන ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම.**

(වියදම් දැරිය හැකි කාර්යය අනුව, ලේඛන වෙන් කර ඇමුණුම් ඉදිරිපත් කළ යුතු ය.)

පනතේ 6(5) උපවගන්තියට පූර්ණ අවධානය යොමු කරන්න.

## ආදායම් පිළිබඳ වාර්තා

බැංකුව : ................................................................................................................................................

ශාඛාව : ................................................................................................................................................

බැංකු ගිණුම් අංකය : ...................................................................................................................................

| මූල්‍යමය/ ද්‍රව්‍යමය/ සේවා ලැබීම් ද යන්න | ලැබීම්වල ස්වභාවය (ද්‍රව්‍යමය/ ත්‍යාග/ ණය/ අත්තිකාරම්/ තැන්පතු ) | මූල්‍යමය වටිනාකම (රු.) | නම | ජාතික හැඳුනුම්පත් අංකය/ TIN අංකය | ඇමුණුම් පත්‍රිකා අංකය |
|---|---|---|---|---|---|
| මූල්‍යමය | | | | | |
| ද්‍රව්‍යමය | | | | | |
| සේවා | | | | | |

මුළු ආදායම -: ................................................................................................................................................

(සියලුම වියදම් ද්‍රව්‍යමය හා මූල්‍යමය ආකාරයට වෙළඳපොළ වටිනාකම මත ඇස්තමේන්තු ගත කළ යුතු ය.)

පනතේ 6(4) වගන්තිය ප්‍රකාරව තොරතුරු ඇතුළත් කළ යුතු ය.

පනතේ 5 වන වගන්තිය පිළිබඳව සැළකිලිමත් විය යුතු ය.

ද්‍රව්‍යමය ලෙස ලැබුණේ නම් ඇස්තමේන්තු කළේ කුමක් ද? පිළිගත් පුද්ගලයෙක් ද, ආයතනයක් යන්න සඳහන් කරන්න.

TIN - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංකය

# අපේක්ෂකයා විසින් පිරවිය යුතු දිවුරුම් ප්‍රකාශය
## (ක්‍රියාපටිපාටි අංක 1.2.1 අනුව දිවුරුම් ප්‍රකාශය)

### දිවුරුම් ප්‍රකාශය

................................................................................................................................ (ලිපිනය) හි පදිංචි......................................................................................................................................................
................................................(නම) වන මම බෞද්ධාගම්කාරයකු/ රෝමානු කතෝලිකයකු/ හින්දු භක්තිකයකු/ මුස්ලිම් භක්තිකයකු ලෙස ගාම්භීර පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙස ප්‍රතිඥා දී/ දිවුරා ප්‍රකාශ කර සිටින වග නම්,

1. ඉහත නම් සඳහන් ප්‍රතිඥාකරු / දිවුරුම්කරු මම වෙමි.
2. 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගන්නා ඡන්ද විමසීමේ මම අපේක්ෂකයකු වෙමි.
3. එසේ අපේක්ෂකයකු වීම නිසාම 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ සියලු වගන්ති මඟින් ප්‍රකාශිත කරුණු ඉටු කිරීමට මා බැඳී සිටින බව දන්නා බවත්,
4. 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව තීරණය කරන ලද අවසරලත් මුදලේ වියදම් සීමාව නොඉක්මවන පරිදි මෙම මැතිවරණයේ දී වියදම් කටයුතු කළ බවත්,
5. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 5 වන වගන්තියේ පිළිගැනීම තහනම් කර ඇති පරිත්‍යාග පිළිගැනීම හෝ භාරගැනීම නොකළ බවත්,
6. පනතේ ප්‍රකාශ කර ඇති ආකාරයට මෙම වියදම් වාර්තාව දින 21ක් තුළ භාර දී ඇති බවත්,
7. භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්ව හා මැතිවරණ නීතිය බලපවත්වන කාලය තුළ දරන ලද වියදම් වර්ග සියල්ලෙහිම තොරතුරු ආදායම් හා වියදම් වාර්තාවේ හා අනෙකුත් ලේඛනවල නිවැරදිව ඇතුළත් කර ඇති බවත්,
8. මැතිවරණය සඳහා ලැබුණු පරිත්‍යාග හා දායකත්වයන්හි සියලු වටිනාකම් නිසි ලෙස ඇස්තමේන්තුගත කර ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කර සිටිමි.
9. මෙම දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරනු ලබන උපලේඛනවල සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

................................
අපේක්ෂකයාගේ අත්සන

ඉහත දිවුරුම් ප්‍රකාශය කියවා තේරුම් ගැනීමෙන් පසුව ........... වර්ෂයේ ........ මස ....... දින දී ප්‍රතිඥා දී/ දිවුරුම් දී මා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

................................
දිවුරුම් කොමසාරිස් /සාමදාන විනිසුරු
අත්සන

*රුපියල් 50 මුද්දරයක් මත අත්සන යොදන්න.

# දේශපාලන පක්ෂය විසින් පිරවිය යුතු දිවුරුම් ප්‍රකාශය

## දිවුරුම් ප්‍රකාශය

........................................................................................................................(ලිපිනය) හි පදිංචි

........................................................................................................................

........................................................................................................................(නම)

වන මම බෞද්ධාගම්කාරයකු/ රෝමානු කතෝලිකයකු/ හින්දු භක්තිකයකු/ මුස්ලිම් භක්තිකයකු ලෙස ගාම්භීර පූර්වකවත්, අවංකවත්, සත්‍ය ලෙස ප්‍රතිඥා දී/ දිවුරා ප්‍රකාශ කර සිටින වග නම්,

1. ඉහත නම් සඳහන් ප්‍රතිඥාකරු / දිවුරුම්කරු මම වෙමි.
2. 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගන්නා ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයකු ලෙස ඉදිරිපත් වන ........................................................................................ පිළිගත් දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ ලේකම්වරයා/ අපේක්ෂකයාව නම් කරන ලද ඡන්දහිමි නාමලේඛනයේ නම සඳහන් පුරවැසියා මම වෙමි.
3. මෙම දේශපාලන පක්ෂය/ වෙනත් දේශපාලන පක්ෂය 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ සියලු වගන්ති මගින් ප්‍රකාශිත කරුණු ඉටු කිරීමට මා බැඳී සිටින බව දනිමි.
4. 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව තීරණය කරන ලද අවසරලත් මුදලේ වියදම් සීමාව නොඉක්මවන පරිදි මෙම මැතිවරණයේ දී වියදම් කටයුතු කළ බවත්,
5. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 5 වන වගන්තියේ පිළිගැනීම තහනම් කර ඇති පරිත්‍යාග පිළිගැනීම හෝ භාරගැනීම නොකළ බවත්,
6. පනතේ ප්‍රකාශ කර ඇති ආකාරයට මෙම වියදම් වාර්තාව දින 21ක් තුළ භාරදුන් බවත්,
7. භාරගනු ලැබූ පරිත්‍යාග හෝ දායකත්වයෙන් හා මැතිවරණ නීතිය බලපවත්වන කාලය තුළ දරන ලද වියදම් වර්ග සියල්ලෙහිම තොරතුරු ආදායම් වියදම් වාර්තාවේ හා අනෙකුත් ලේඛනවල නිවැරදිව ඇතුළත් කර ඇති බවත්,
8. මැතිවරණය සඳහා ලැබුණු පරිත්‍යාග හා දායකත්වයන්හි සියලු වටිනාකම් නිසි ලෙස ඇස්තමේන්තුගත කර ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කර සිටිමි.
9. මෙම දිවුරුම් ප්‍රකාශය සමඟ ඉදිරිපත් කරනු ලබන උපලේඛනවල සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

..............................................................

ඉහත දිවුරුම් ප්‍රකාශය කියවා තේරුම් ගැනීමෙන් පසුව .......................... වර්ෂයේ ................ මස .......... දින දී ප්‍රතිඥා දී/ දිවුරුම් දී මා ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

පිළිගත් දේශපාලන පක්ෂයේ/
වෙනත් දේශපාලන පක්ෂයේ/
ලේකම්වරයාගේ/ ඡන්දහිමියාගේ අත්සන

....................................

දිවුරුම් කොමසාරිස්/සාමදාන විනිසුරු අත්සන

•ඡන්දහිමි නාම ලේඛනයේ නම ඇතුළත් අය නම් හිස්තැනට කෙටි ඉරක් සලකුණු කරන්න.

•රුපියල් 50 මුද්දරයක් මත අත්සන යොදන්න.

සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව

## වියදම් වාර්තා පරීක්ෂා කිරීම සඳහා අවස්ථාව ලබා ගැනීම

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :......................................................................................................

......................................................................................................

......................................................................................................

02. හැඳුනුම්පත් අංකය: | | | | | | | | | | | | |

03. ලිපිනය : ......................................................................................................

......................................................................................................

04. රැකියාව : ..................................................................

05. දිස්ත්‍රික්කය : ..............................................................

06. දුරකථන අංකය : ..........................................................................................

ඉහත තොරතුරු ලබා දී ඇති මා හට ..............................................................(පක්ෂයේ නම) පක්ෂයෙන් 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගන්නා මැතිවරණය සඳහා තරග කරන...................................................................................................................................

(අපේක්ෂකයාගේ නම) විසින් ලබා දී ඇති වියදම් වාර්තාව පරීක්ෂා කිරීම සඳහා අවසර ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

(සැ.යු. මෙම ලේඛන පරීක්ෂා කරන අවස්ථාවේ දී එකී ලේඛන විකෘති කිරීම, හානි කිරීම හා පරිශ්‍රයෙන් බැහැරට ගෙන යාම පොදු දේපළ සුරැකීමේ පනතේ ප්‍රතිපාදන යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් වන බවත් එසේම ලිපි ලේඛන පරීක්ෂා කිරීම මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු බවත් මම හොඳින් දනිමි.)

දිනය: ...................................

..........................................................................
ඉල්ලුම්කරුගේ අත්සන

.............................................................................................. දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ ඡන්දහිමියා යෝජිත.................................................................................... අපේක්ෂකයාගේ .............................................................................................. දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ ඡන්දහිමියා යෝජිත අපේක්ෂකයාගේ වියදම් වාර්තා පරීක්ෂා කිරීම සඳහා .....................................දින පෙ.ව./ ප.ව. ............................ සිට පෙ.ව./ ප.ව. ........................... දක්වා කාලය ලබා දෙන බව දන්වා සිටිමි.

දිනය: ...................................

..........................................................................
මැතිවරණ කොමසාරිස් ජනරාල්/
මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙනුවට

*අදාළ නොවන වචන කපා හරින්න. අදාළ නැති හිස්තැන් සඳහා කෙටි ඉරක් අඳින්න.

උපලේඛන 05

සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව

## වියදම් වාර්තාවේ සහතික කරන ලද පිටපතක් ලබා ගැනීම

01. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : ..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

02. හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

03. ලිපිනය : ..............................................................................................................
..............................................................................................................

04. දුරකථන අංකය : ..........................................................................

ඉහත තොරතුරු ලබා දී ඇති මා හට ......................................................................................... (දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ ඡන්දහිමියා යෝජිත අපේක්ෂකයා) දිස්ත්‍රික්කයේ ....................................... ඡන්ද කොට්ඨාසයේ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ මැතිවරණය සඳහා තරග වදින ..............................................................................................................

(අපේක්ෂකයාගේ නම) දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ ඡන්දහිමියා යෝජිත අපේක්ෂකයාගේ වියදම් වාර්තාවේ සහතික කරන ලද පිටපතක් ලබා දෙන ලෙසත් ඒ සඳහා වූ මුදල ..........................................අංක දරන රිසිට්පතින් ගෙවා ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි.

දිනය: ....................................

..............................................................
ඉල්ලුම්කරුගේ අත්සන

..............................................................................................(දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ ඡන්දහිමියා යෝජිත අපේක්ෂකයා) 2024 ජනාධිපතිවරණය සඳහා තරග වදින .................................................................... අපේක්ෂකයාගේ වියදම් වාර්තාවේ සහතික කළ පිටපතක් ලබාදීම අනුමත කරමි.

දිනය: ....................................

..............................................................
මැතිවරණ කොමසාරිස් ජනරාල්/
මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙනුවට

උපලේඛන 06

සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව

## 2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමන පනත යටතේ පැමිණිලි කිරීම

01. සම්පූර්ණ නම : ..............................................................................................................................................
..............................................................................................................................................

02. ලිපිනය: ..............................................................................................................................................
..............................................................................................................................................

03. දුරකථන අංකය : ......................................................................................................
04. හැඳුනුම්පත් අංකය : ......................................................................................................

පැමිණිල්ල
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
..............................................................................................................................................
ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

දිනය: ....................................

..................................................................
පැමිණිලිකරුගේ අත්සන

*අදාළ නොවන වචන කපා හරින්න.

පැමිණිල්ල සනාථ කෙරෙන ලේඛන ඇතොත් ඉදිරිපත් කරන්න.

1. මෙම පැමිණිලි සෘජුවම පොලිස් ස්ථාන වෙත ද ඉදිරිපත් කළ හැකි ය.

---

2023 අංක 03 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීම පනත යටතේ
..............................................................................................................................................
මහතා/ මිය විසින් කරන ලද පැමිණිල්ල ............................................................දී.....................................................
විසින් පෙ.ව./ ප.ව. ..............................ට භාරගත් බව දන්වමි.

# වියදම් වාර්තා ලැබීම පිළිබඳ දෛනික වාර්තාව

දිනය: ..................................

කාලය : පෙ.ව. ................. සිට ............................ ප.ව.

| ලියාපදිංචි අංකය | දේශපාලන පක්ෂය/ ස්වාධින කණ්ඩායම/ අපේක්ෂකයා | වාර්තාව ලබාදුන් අයගේ නම, ලිපිනය හා ජාතික හැඳුනුම්පත් අංකය | දුරකථන අංකය | ලැබුණ වේලාව | වෙනත් |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

ලැබුණ සියලු වියදම් නියාමන වාර්තාවල එකතුව : ..................................

සංඛ්‍යාව : ..................................

අත්සන : ..................................

තනතුර : ..........................................................................................

උපලේඛන 08

ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
............................................

## වියදම් වාර්තාවල මුල් පිටපත් ශ්‍රී ලංකා පොලීසියට භාරදීම

.......................................................................................................................................................නම දරන දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ ඡන්දහිමියා යෝජිත අපේක්ෂකයා ලෙස 2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම සඳහා තරග කරන..................................................................................................................................අපේක්ෂකයා විසින් භාරදෙන ලද මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත යටතේ භාරදෙන ලද වියදම් වාර්තාවේ මුල් පිටපත .................................. පැමිණිල්ල වෙනුවෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා ..................................................................... පොලිස් ස්ථානයේ ......................................................................................................................නිලධරයා වෙත ............................ දින පෙ.ව./ ප.ව ............................ ට ........................................ ස්ථානයේ දී භාර දෙන ලදී.

.............................................................

භාරදුන් අයගේ අත්සන

නම : .......................................................................................

තනතුර : ..............................................................................

නිල මුද්‍රාව

හැඳුනුම්පත් අංකය : ..........................................................

ඉහත ප්‍රකාශය සත්‍ය ලෙස පිළිගනිමු.

ඒ අනුව.......................................................................................................................... දේශපාලන පක්ෂයේ/ වෙනත් දේශපාලන පක්ෂයේ/ ඡන්දහිමියා යෝජිත ........................................................................... අපේක්ෂකයාගේ මැතිවරණ වියදම් නියාමන පනත යටතේ ................................................ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාර දී ඇති වාර්තාව ..................... දින පෙ.ව./ ප.ව......................... ට ...................................... ස්ථානයේ දී භාර ගන්නා ලදී.

...................................................................

භාරගත් අයගේ අත්සන/ භාරගත් නිලධාරීගේ අත්සන

නම : .........................................................................................

නිල නාමය : ..............................................................................

පදවිය : .....................................................................................

නිල මුද්‍රාව

හැඳුනුම්පත් අංකය : ..................................................................

නිල හැඳුනුම්පත් අංකය: .............................................................

ඇමුණුම - 01

## 6 (5) වගන්තිය අනුව නිදහස් කරන ලද වියදම්

ආදායම් වාර්තාවේ වාහනය පිළිබඳ ඉල්ලන ලද තොරතුරු ලබා දිය යුතු නමුත් එය ආදායම් වියදම් වාර්තාවේ ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ.

(I) අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු

1. අපේක්ෂකයාගේ ප්‍රවාහන කටයුතු සඳහා අනුමැතිය ලබාගත් වාහන අංකය : ......................................

2. වාහනයේ වර්ගය : යතුරුපැදි/ කාර්/ වෑන්/ ජීප්/ බස්/ ලොරි/ බෝට්ටු/ හෙලිකොප්ටර් (අනවශ්‍ය වචන කපා හරින්න.)

3. අනුමැතිය ලබාගත් අමතර වාහනයේ අංකය* : ......................................

4. නිත්‍ය රියදුරුගේ නම : ......................................
......................................

5. නිත්‍ය රියදුරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : ......................................

6. රියදුරුට වේතනයක් ලබා දෙනු ලබයි. ඔව් : ☐ නැත : ☐

7. නිත්‍ය වාහනය අපේක්ෂකයාගේ ද ඉල්ලාගත් එකක් ද යන වග : ......................................

   වාහනයේ අයිතිය : අපේක්ෂකයා සතුයි./ ඉල්ලාගත් වාහනයකි./ කුලියට ලබාගත් වාහනයකි.

8. නිත්‍ය වාහනය ඉල්ලාගත්/ කුලියට ගත් වාහනයක් නම් :

   I. ලියාපදිංචි අයිතිකරුගේ/ ආයතනයේ නම: ......................................
   ......................................
   ......................................

   II. ලිපිනය : ......................................
   ......................................

   III. ජාතික හැඳුනුම්පත් අංකය : ......................................

